# තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
# மூன்றாம் நிலைக்கல்வி, தொழிற்கல்வி ஆணைக்குழு
# TERTIARY AND VOCATIONAL EDUCATION COMMISSION

TVEC

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
திறன்கள் அபிவிருத்தி மற்றும் வாழ்க்கைத் தொழில்பயிற்சி அமைச்சு
**Ministry of Skills Development and Vocational Training**


| දිනය<br>திகதி<br>Date | මගේ අංකය<br>எனது எண்<br>My No. | ඔබේ අංකය<br>உமது எண்<br>Your No. |
|---|---|---|

ජා.වෘ.සු.චක්‍ර ලේඛන අංක : NVQ – 2018-02

<u>ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 සහ 6 පාඨමාලා ඉංග්‍රීසි හෝ සිංහල හෝ දෙමළ යන භාෂාත්‍රයෙන් තමන් කැමති මාධ්‍යයකින් හැදෑරීමට අවස්ථාව ලබා දීමයි.</u>

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 5(1) හා 5(2) වගන්තිය යටතේ ගරු විෂය භාර ඇමතිතුමාහට පැවරී ඇති බලතල ප්‍රකාරව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 සහ 6 පාඨමාලා පැවැත්විය යුතු මාධ්‍ය පිළිබඳව ගරු අමාත්‍යතුමා විසින් පහත සඳහන් නියෝගය නිකුත් කර ඇත.

" NVQ 5 සහ 6 පාඨමාලා පැවැත්වෙන විශ්වවිද්‍යාල විද්‍යායතන හා තාක්ෂණ විද්‍යාලවල එම පාඨමාලා පැවැත්වෙනුයේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. NVQ 5 සහ 6 පාඨමාලාවලට ඇතුළත්වන සිසුන්ගේ ඉල්ලීම පරිදි 2019 වසරේ සිට එම පාඨමාලා ඉංග්‍රීසි හෝ සිංහල හෝ දෙමළ යන භාෂාත්‍රයෙන් තමන් කැමති මාධ්‍යකින් හැදෑරීමට අවස්ථාව සලසා දිය යුතු ය. දැනටමත් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන්ද සිංහල හෝ දෙමළ භාෂා මාධ්‍යයෙන් පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන්ද සිංහල හෝ දෙමළ භාෂා මාධ්‍යයෙන් පැවැත්වීමට හැකිවන පරිදි සංශෝධනය කළ යුතුය. 2018 වසරේ හෝ ඉදිරියේදී අලුතින් ආරම්භ කරනු ලබන NVQ 5 සහ 6 පාඨමාලා වේනම් ඒවාද සිසුන්ගේ ඉල්ලීම පරිදි ඉංග්‍රීසි හෝ සිංහල හෝ දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගත යුතු අතර, එකී පාඨමාලාවන්හි කර්මාන්තගත (Industry) අවශ්‍යතාවයද මෙහිදී සැලකිල්ලට ගත යුතුය."

ඒ අනුව අදාළ පාඨමාලා පැවැත්වීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි. මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු අවශ්‍ය වේනම් මා වෙත දැනුම්දෙන මෙන් ඉල්ලා සිටිමි.

ජානක ජයලත්
අධ්‍යක්ෂ ජනරාල් (වැ.ආ)


නිපුණතා පියස, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05. நிபுனதா பியச, 354 2, எல்விடிகல மாவத்தை கொழும்பு 05. Nipunatha Piyasa,354/2,Elvitigala, Mawatha,Colombo5,Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone } 011-5849291
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2555007
වෙබ් අඩවිය / இணைய தளம் / Web Site } www.tvec.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail } info@tvec.gov.lk



SLSI SYSTEM CERTIFIED ISO 9001

"ජාතික වෘත්තීය සුදුසුකම් මගින් පිළිගත් වෘත්තීය නිපුණතාවන්" "NVQ ஊடாக சான்றுறுதிப்படுத்தப்பட்ட வாழ்க்கைத்தொழில் தேர்ச்சிகள்" *"Certified Vocational Competencies through NVQ"*